# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2446/30 – 2025 ජූලි මස 21 වැනි සඳුදා – 2025.07.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**



## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය, අංක 12/01, දුවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කළල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, අංක 15, කැප්ටන් එම්.ජී.ජී. මෙන්ඩිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2021/143.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ස්වාධීන මෝටර් රථ සේවක සමිතිය, අංක 12/01, දුවන පල්ලිය පාර, උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බණ්ඩාරවෙල ඩිපෝවේ සේවය කර දැනට විශ්‍රාම ගොස් සිටින කේ.ශාන්ත කුමාර ආමර් පෙරේරා මහතාව,

- 2015.04.06 දින සිට සහකාර කළමනාකාර (ධාවන) වැඩ ආවරණයට පත් කිරීම ද
- 2019.02.05 දින සිට එම ඩිපෝවේම ඩිපෝ කළමනාකාරු ලෙස පත් කිරීම ද
- 2020.10.19 දින සිට ඩිපෝ කළමනාකාර තනතුරෙන් ඉවත් කිරීම සිදුකර 2015 වර්ෂයේ සිට වැඩ ආවරණය කළ සහකාර කළමනාකරු (ධාවන) තනතුරවත් ලබා නොදී ඉන්ධන පාලක තනතුරේ වැඩ පැවරීම

මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0249

---

මගේ අංකය: IR/COM/03/2022/19.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එම්.එම්. යුසුෆ් මයා, අංක 296/14, ටොරිංටන් මාවත, කොළඹ 05.

සහ

හේලීස් ෆෙන්ටන්ස් ලිමිටඩ්, අංක 180, ඩීන්ස් පාර, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් සීදුව, ලියනගේමුල්ල, HPT ප්‍රධාන පාර, 31/1 නීතිඥ සී.ඒ.එච්.එම්. විජේරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ආචාර්ය **අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2022/19.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්.එම්. යුසුෆ් මයා, අංක 296/14, ටොරිංටන් මාවත, කොළඹ 05.

සහ

හේලීස් ෆෙන්ටන්ස් ලිමිටඩ්, අංක 180, ඩීන්ස් පාර, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"හේලීස් ෆෙන්ටන්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කළ එම්.එම්.යුසුෆ් මහතාට 2020 අප්‍රේල් සිට ජූනි මාසය දක්වා කාලසීමාව සඳහා වූ වාහන දීමනාව, විශේෂ දීමනාව හා 2019/2020 වර්ෂයට අදාළ කොමිස් මුදල් නොගෙවීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්.එම්.ඩී.එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0250

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.